# ඩාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

37 වන කාණ්ඩය | 03 වන කලාපය | 2021 මාර්තු


# කොරෝනාවටත් පරාජය කළ නොහැකි වූ ඇගේ දිනය

# ජාත්‍යන්තර ස්ත්‍රී දින සැමරුම 2021




ඩාබිඳු සාමුහිකය විසින් කටුනායක සහ බියගම නිදහස් වෙළඳ කලාපයෙන් හි කම්කරු කාන්තාවන් සමඟ සමරන ලද ජාත්‍යන්තර කාන්තා දින සැමරුම 2021 මාර්තු මස 07 වන ඉරු දින කුරණ වයිට් පැලස් උත්සව ශාලාවේදී පැවැත්විණි. මේ සඳහා 180කට ආසන්න පිරිසක් සහභාගි වූ අතර කම්කරුවන් 150ක් ඒ අතර විය.

ප්‍රථමයෙන්ම එදින උදෑසන කටුනායක ඇවරිවත්ත පොලිසිය අසල සංවිධාන කිහිපයක එකතුවෙන් කාන්තා දින පෙළපාලියක් පවත්වන ලදී. එහිදී

- C - 190 ප්‍රඥප්තිය අපරානුමත කරනු
- කොවිඩ් එන්නත නිදහස් වෙළඳ කලාප සේවකයන්ට ලබාදෙනු
- කාන්තා හිංසනය පිටුදකිමු
- වාර්ෂික බෝනස් ලබා දෙනු
- භාෂා අයිතියට ගරු කරනු
- රැකියා සුරක්ෂිත කරණු
- මැන් පවර් සේවකයින් ස්ථිර කරනු
- නිදහස් වෙළඳ කලාපයේ ඉඩම් අහිමිවූවන්ට ස්ථිර වාසස්ථාන ලබාදෙනු
- සමාජ සංරක්ෂණ ක්‍රමයක් ඇතිකරනු

සේවක සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කරනු යන ඉල්ලීම් 10 මුල් කරගනිමින් විරෝධතාව දියත් විය.

අනතුරුව පෙරවරු 10.30ට පමණ කාන්තා දින සැමරුම ආරම්භ විය. ආරාධිතයන් පිළිගෙන පහන් දල්වා කම්කරු කාන්තාවක කළ පිළිගැනීමේ නර්තනයෙන් අනතුරුව ආරම්භක කතාව ඩාබිඳු සම්බන්ධිකාරිකා චමිලා තුෂාරි විසින් සිදු කරන ලදී.


10 වන පිටුවට...


## ඇතුළු පිටු


**03 පිටුව** - වියැකී යන මානව හිමිකම්
**04 පිටුව** - සවිබල ගැන්විය යුතු කාන්තාව පමණද?
**05 පිටුව** - සුව හා රුව
**06 - 07 පිටුව** - අපේ වැඩ
**08 පිටුව** - කාන්තා දිනයට පමණක් සීමා වු ඇය
**09 පිටුව** - සිතුවිල්ල / ප්‍රහේලිකාව
**10 පිටුව** - කොරෝනාවටත් පරාජය කළ නොහැකි වූ ඇගේ දිනය... ඉතිරිය

## ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක

දුර : 011 4 851 383

ඊ. මේල් : dabindu.infoco@gmail.com

Facebook : dabindu collective sri lanka


# අභියෝග සමඟ සන්නද්ධ වූ ජාත්‍යන්තර ස්ත්‍රී දිනය

මෙවර ජාත්‍යන්තර ස්ත්‍රී දිනය සමරන්නේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන බහුතරයක් වූ ස්ත්‍රීන්ට සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වශයෙන් විඳින්නට සිදු වී ඇති ගැටළු රාශියක් මධ්‍යයේය, එසේම කොවිඩ් වසංගතය ද බහුතරයක් වූ කාන්තාවන්ට අභියෝග එල්ල කොට ඇත.

ස්ත්‍රියට යුක්තිය පසඳලීමේ දී හැමවිටම අයුක්ති සහගත තත්වයක් ගැනීම සෑම ක්ෂේත්‍රයකම ස්ත්‍රීන් මුහුණපාන තත්වයකි. කොපමණ නීති රීති පැවතියත් ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක නොවීම නිසා ඒවායේ රැකවරණය අහිමිකොට ඇත. දිනෙන් දින පැයෙන් පැය ස්ත්‍රියට එරෙහි සිදුවන හිංසනයෙන් වාර්තාගත ලෙස ඉහළ ගියත් එවා පැමිණිලි නොකරන එවාද කොතෙකුත් ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා නිසා දිනකට රෝහල්ගත වන පිරිස 12ක් දක්වා වැඩී වී ඇති බවද ජාතික රෝහල් වාර්තා සඳහන් කරයි.

මේ වන විට රට තුළ අඛණ්ඩ සත්‍යග්‍රහයන් කිහිපයක්ම පැවැත්වෙන අතර ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා එහි මූලික වින්දිතයින් වන ස්ත්‍රීන් එහි මූලිකත්වයගෙන කටයුතු කරයි.

ඇඟළුම් ක්ෂේත්‍රයේ ස්ත්‍රීන් ද කොවිඩ් වසංගතය හමුවේ රැකියා කප්පාදුව මෙන්ම ඔවුන්ට හිමි වරප්‍රසාද හා ප්‍රතිලාභ භුක්ති විඳීම අහිමිකොට ඇත. මේ මොහොතේ රටේ ආර්ථිකය රැකගැනීමට පෙරමුණ ගෙන කටයුතු කරන නිදහස් වෙළඳ කලාප සේවකයින්ට 2020 දෙසැම්බර් මස දී මහබැංකු වාර්තා පෙන්වා දෙන පරිදි කාර්මික අපනායනයන් තුළින් 2019 වසරට සාපේක්ෂව පහත වැටුන ද ශල්‍ය හා වෙනත් අත් වැසුම් අපනායනය කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරයි. එහි වෙනස 2019 සාපේක්ෂව 106.07 සිට 2020 දෙසැම්බර් වල දී 224.4 වෙනසකි. මෙසේ ලාභ ලබා තිබියදීත් සේවකයින් කොවිඩ් වසංගතය හමුවේ අවධානමක් රැගෙන අඛණ්ඩව රැකියා කරමින් ක්ෂේත්‍රය රැකගැනීමට මහත් වෙහෙසක් ගනු ලැබිණි. ආරක්ෂිත සේවා පරිසරයක් නොමැතිව අදටත් ඒ අවධානම හමුවේ කටයුතු කරන සේවකයින් කෙරෙහි වගකිව යුත්තන් අවධානය යොමු කළ යුතුයි.

කොවිඩ් එන්නත ලබා දීමට ප්‍රමුඛතාවය දිය යුතුවා මෙන්ම, හිඟ වැටුප් සමඟ බෝනස් ලබා දීමටද රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීමටද සමාජ සංරක්ෂණ ක්‍රම පිළිබඳ විධිමත් ක්‍රම සම්පාදනය කිරීම ද, මැන් පවර් සේවකයින්ගේ රැකියා ස්ථිර කිරීමටද, සේවකයින්ගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම ද බලධාරීන් කටයුතු කළ යුතුව ඇත.

# ඇය

දශක ගණනාවක් සිට, විවිධ තේමාවන් යටතේ මාර්තු 08 වනදාට යෙදී ඇති ජාත්‍යන්තර කාන්තා දිනය සමරනු ලබයි. මෙයට මූලික හේතු වී ඇත්තේ 1919 දී. ඩෙන්මාර්කයේ කෝපහෙගන් නුවර පැවති සමාජවාදී කාන්තා සමුළුවකදීය. එයට පෙර 1857 දී ඇමරිකානු පෙහේ කම්හලක සේවය කළ කම්කරු ස්ත්‍රීන්, ඔවුන්ගේ දිනකට පැය 16 ක සේවා කාලය පැය 10 දක්වා අඩු කරන ලෙස, අරගලයක යෙදුනු අතර 1908 මාර්තු 08 වනදා නිව්යෝක් නුවර පෙහෙකම්හලේ කම්කරු ස්ත්‍රීන් තමන්ට මුහුණ දීමට සිදු වී ඇති අමානුෂික සේවා අහෝසි කරන මෙන් ඉල්ලා වීදි බැස උද්ඝෝෂණය කරන ලදි.

1917 දී ප්‍රෙට්රෝගැඩ් නුවර ස්ත්‍රී කම්කරුවන් තම පීඩනයට එරෙහිව වැඩ වර්ජනයක යෙදිනි. එදා ඒ ස්ත්‍රී පීඩනයට එරෙහිව තම අයිතීන් ලබා ගැනීම සඳහා සටන් කළ ඉතිහාසයයි.

වසර 111 ගත වුවද අදටත් ලෝකයේ බොහෝ රට වල කාන්තාවන් විවිධ පීඩනයන්ට ලක්වන බව නොරහසකි. එදා සිට අද දක්වා බලහත්කාර ලිංගික අපචාරයන්ට විවිධ පීඩනයන්ට ලක්වන බව දක්නට ලැබේ.

අප රට තුළ ජීවත්වන ජනගහණයෙන් 52% කාන්තාවන්ය. සාක්ෂරතාව අතින්ද ඉහළ මට්ටමකින් සිටී. පෙරට වඩා දැනුම අවබෝධය හා ඉහළ නිල තල වල රැකියා කරනු ලබයි. විදේශ විනිමය උපයා දෙන්නාවූ විවිධ ක්ෂේත්‍ර තුළ බහුතරයක් කාන්තාවන්ය. මෙවන් ස්ථානයන් හි දී ද ඇය දැඩි පීඩනයන්ට ලක් වන බව කවුරුත් දන්නා කරුණකි.

එදා කුස්සිය මුල්ලට හිරවී සිටි කාන්තාව වත්මන් සමාජය සංකීර්ණ වීම තුළ කාන්තාවන්ටද එකී සමාජය වටා අනුගමනය වීමට සිදු වී ඇති අතර ඇයට එහිදි බොහෝ ගැටළු වලට මුහුණ පෑමට සිදු වී ඇති බව පැවසිය යුත්තක් නොවේ. ඇය සතු ගෞරවය විනාශ වී ගොස් ඇති බව පෙනෙන්නට ඇත. මෙම දියුණු යැයි කියා ගන්නා සමාජ ක්‍රමය තුළ වුවද ඇය පෙර ගතානුගතිකත්වය සිරිත් වලින් ගැලවී යන්නට හැකි වූ බවක් නම් දක්නට නැත.

අතීතයේ මෙන්ම කාන්තාවන්ට ස්වාධීන ජීවිතයක් නැතැයිද ඇය පුරුෂාධිපත්‍යය යටතේ ජීවත් විය යුතු යැයි අදහන අයද අප සමාජය තුළ වෙසෙති. එමෙන්ම තමාට ස්වාධීන තීරණ ගැනීමේ අයිතියක් ඇතැයිද සමාජයේ සිතන්නට මැලිවන කාන්තාවන්ද සිටිති. එසේම කාන්තාවන්ගේ මුළු ජීවිතයම නිවසට කොටුකර තැබීමට උත්සහ දරණ අය අදත් එදා මෙන් සිටිති. මෙයට ආගම් තුළින්ද යම්කිසි බලපෑමක් ඇති කරනු ලබයි.

දරුඵල නොලබන කාන්තාවන් දෙස බලන්නේ වපර ඇසිනි. එසේම තම සැමියා මිය ගිය පසු ඇයවද සමාජයෙන් කොන් කිරීමක් කරනු ලබයි. ගමනක් යන විට දී ඇයව ඉස්සරහින් මුණ ගැසුනොත් යන ගමනට ද බාධා වෙතැයි සිතන සමාජයක් තවමත් පවති.

11 වන පිටුවට...



# වගකීම අප අතේය

වසර ගණනාවක සිට ලොව පුරා වෙසෙන කාන්තාවන් මාර්තු මසට යෙදි ඇති මාර්තු 08 වැනි දිනය සමරන්නේ මෙතෙක් වන තුරුත් සිය අයිතීන් නොලැබූ නිසාය. එහෙත් සමහර කාන්තාවන් තමන් වෙනුවෙන් එවැනි දිනයක් ඇති බව නොදනී බවට සැකයක් නැත. එ පිළිබඳ ඔවුන් දැන සිටියත් එ දිනය සැමරීමට තරම් වරම් නොලද කාන්තාවන් අප රට තුළ වෙසෙති.

කාන්තාවන්ට අන් කවරදාටවත් වඩා රැකියා පහසුකම ලැබී ඇති බවද යම් තරමින් විමුක්තියක් උදා කර ගෙන ඇති බව ඇතැම් අය පැවසුවත්, ඇත්ත වශයෙන් එය ලැබී තිබේද?

පෙර මෙන් නොව වර්ථමානයේ ජීවත් වන කාන්තාවන්ට කුමන හෝ රැකියාවක් කිරීමට අවස්ථා ලැබී ඇත. නමුත් ඒ රැකියා අවස්ථා බෙහෝ විට ලැබී ඇත්තේ පාලක හස්තයන්ට නතු කර ගෙනය. එසේම රැකියා සපයන්නන්ට කාන්තාව සූරාකෑම ඇති අයිතිය හා අවස්ථා වැඩි වී ඇති. එසේම ශ්‍රම සූරාකෑම කායිකව මෙන්ම මානසික පීඩනය තීව්‍ර කර ඇත. මෙම පීඩනය වැඩි වශයෙන් සිදු වන්නේ නිදහස් වෙළඳ කලාපයන් තුළය. බොහෝ විට මෙහි සේවය කරන කාන්තාවන් සිය කැමැත්තෙන් නොවන අතර ආර්ථික රාටාව විසින් කිනම් රැකියාවක යෙදෙන ලෙස ඇයට බලකර සිටින නිසාවෙනි. එම නිසා ඔවුන්ව නිහඩ සේවයක් කිරීමට සිදු වී ඇත.

ඔවුන් සතුව විය යුතු මූලික අයිතිවාසිකම් පවා බොහෝ විට උදුරා ගෙන ඇත. එසේම කාන්තාවන්ට සිදුවන අපරාධ ප්‍රමාණය දිනෙන් දින වැඩිවීමක් දක්නට ඇත. රට තුළ තාක්ෂණ හා සමාජීය ආර්ථික රටාවක් තුළ කාන්තා හිංසනය වැඩි වී ඇත. කොවිඩ් 19 තුළ ඔවුන්ගේ කායික, මානසික පීඩනය තිව්‍ර කර ඇත. එමෙන්ම බාහිර සමාජයේ දි මෙන්ම ස්වකීය නිවස තුළදී ද අනාරක්ෂිත තත්වයකට පත් වී ඇති බව නොරහසකි.

සැබවින්ම වත්මන් කාන්තාව මේ ආකාරයෙන් කම්හලේ දී මඟතොට දි. නිවහනෙදී මෙන්ම ආර්ථික හා සමාජීය හේතූන් නිසා දැඩි පීඩනයකට ලක් වී ඇත. එසේම ඉන් මිදීමට අතිශය දුෂ්කර කාර්යයක් බැව් සත්‍යයකි. නමුත් ඉතා අපහසුවෙන් හෝ මෙම තත්වයෙන් මිදීමට බලපෑම් කිරීමේ ශක්තිය පවතින්නෙද අප තුළමය.

ඉන්ද්‍රා සමන්මලී

# සවිබල ගැන්විය යුතු කාන්තාව පමණද?



කාන්තා දිනය සමරන කාලයේ දී අපට නිතර අසන්නට දකින්නට ලැබෙන වැකියක් තමයි කාන්තාව සවිබල ගැන්වීම. කාන්තාව අධ්‍යාපනයෙන්, ආර්ථිකයෙන්, නීතිය හා අයිතිවාසිකම් යනා දී සෑම ක්ෂේත්‍රයකින්ම සවිබල ගැන්විය යුතු බව විවාදයට කරුණක් නොවේ. නමුත් මේ ලිපිය කාන්තාව සවිබල ගැන්වීම සම්බන්ධයෙන් නොවේ, පුරුෂයා සවිබල ගැන්වීම සම්බන්ධවයි.

අතීතය සමඟ සන්සන්දනය කරන විට අපි අපේ දියණිවරුන්ට අද දවසේ ගොඩක් දේවල් ලබා දෙනවා. අපේ පුතාට වගේම අපේ දුවටත් හොඳ අධ්‍යාපනයක්, ඇය ක්‍රීඩාවෙන්, කුසලතාවන්ගෙන් ඉදිරියට යවන්නට දෙමව්පියන් උත්සුක වෙනවා. අද දවසේ දියණියන් තනිවම වාහනයක් පදවන, හොඳින් උගත්, සමාජයේ ඕනම ක්ෂේත්‍රයක මුල් පුටුවේ වාඩි වීමට තරම් සුදුසුකම් සහිත පිරිසක්. ඒත් අපේ දේශපාලන ක්ෂේත්‍රය, ව්‍යාපාර ක්ෂේත්‍රය යනාදී එකී මෙකී නොකී සියලු ක්ෂේත්‍ර තවමත් පුරුෂ මූලික වෙලා තියෙන්නේ ඇයි? ඒ අපි අපේ පුතුන් නිසි පරිදි සවිබල ගන්වා නැති නිසයි.

අපේ පුතුන්ගෙන් කී දෙනෙකුට තමන්ගේ හෝ පවුලේ කෑම වේල තනිවම හදන්න පුළුවන්ද? තමන්ගේ ලෙයින් හැදුන දරුවා, බිරිඳ රැකියාවට ගිය විට බලා ගන්න පුළුවන්ද? අසනීප වෙලා ඉන්න දෙමාපියන්ට සාත්තු කරන්න පුළුවන්ද? තමන්ගේ සහ දරුවන්ගේ ඇඳුම් සෝදා මැද ගන්න පුළුවන්ද? මේ වගේ ගෘහාශ්‍රිත කටයුතු වල වගකීම දරන්න අපේ පුතුන්ට අපි පුරුදු පුහුණු කරලා තිබෙනවාද?

අතීතයේ තිබුණ තාත්තා රැකියාවට ගොස් අම්මා ගෙදර වැඩ කටයුතු බලා කියා ගත් ඒ සාම්ප්‍රදායික පවුල් ක්‍රමය දැන් අවසන්. අද පිරිමියා හා උරෙන් උර ගැටී කාන්තාව වැඩ කරනවා. ඇයට රැකියා ස්ථානය තුළ තරඟ කරන්නට සිදු වී ඇත්තේ පිරිමි සේවකයන් සමඟයි. අද දවසේ ජනප්‍රිය වැකියක් තමයි "එක සමාන සුදුසුකම් ඇත්නම්, එක සමාන කැපවීමක් ඇත්නම් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ඕනෑම පුද්ගලයකුට එම රැකියාව තුළ නියමිත ස්ථානය ලැබිය යුතු බව."

නමුත් අපි මේ වගේ උදාහරණයක් ගනිමු. ආයතනයක A සහ B යනුවෙන් සේවකයන් දෙදෙනෙක් සිටිනවා. මේ දෙදෙනාම සමාන සුදුසුකම් සහිත සමාන ලෙස තමන්ගේ රැකියාව වෙනුවෙන් කැප වූ දෙදෙනෙක්. නමුත් A තමන්ගේ රැකියාවෙන් පසුව තමන්ගේ නිවසේ කටයුතු දූ දරුවන් බලා ගැනීමේ වගකීමත් දරනවා. B තමන්ගේ නිවසේ ගෘහාශ්‍රිත වගකීම් වලින් නිදහස්. එහෙමත් නැත්නම් A ට සාපේක්ෂව Bට නිවසේ වගකීම් අඩුයි. මේ ආයතනයේ ඉහළ කළමණාකාරිත්වය A සහ B ගෙන් එක් අයෙකුට උසස් වීමක් දෙන්නට තීරණය කරනවා. මේ උසස් වීම කාට හිමි වෙයිද? ඔබ උසස් වීම දෙන්නෙ කාටද? මම නම් උසස් වීම දෙන්නෙ Aට. ඒකට හේතුව තමයි. ආයතනය තුළ A සහ B ගෙ කැපවීම සහ සුදුසුකම් එක සමාන වුණත් A සමස්තයක් වශයෙන් ගත්තාම වඩාත් දක්ෂයි. බහු කාර්ය හා විවිධ හැකියාවන්ගෙන් යුක්තයි. ඒ වගේ කෙනෙකුට ගැටලු විසඳීමේ හැකියාව, ඉක්මන් නිවැරදි තීරණ ගැනීමේ හැකියාව වැඩියි. ඉතිං මම කැමතියි මගේ ආයතනය තුළ Aට උසස් වීමක් දෙන්න. නමුත් සැබෑ ජීවිතයේ දී සිදුවෙන්නෙ මොකක්ද? A වෙනුවට Bට උසස් වීම හිමිවීම. මොකද A කියන්නෙ කාන්තාවක්. B කියන්නෙ පිරිමියෙක්. කාන්තාවකට තමන්ගේ පවුලේ වගකීම් එක්ක පිරිමියෙක් තරම් හොඳට ආයතනයේ වගකීම් දරන්න බැහැ කියන එක තමයි පොදු මතය.

අධ්‍යාපනය ගත්තත් විශ්ව විද්‍යාල වගේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී ප්‍රතිශතය වැඩියි. නමුත් රැකියා ක්ෂේත්‍රය තුළ ඉහළ ස්ථරයේ පිරිමි ප්‍රතිශතය වැඩියි. සාමාන්‍යයෙන් පිරිමියෙක් රැකියාවකට ඉල්ලුම් කරන විට ඒ අදාළ අවශ්‍යතාවන්ගෙන් දහයකින් තුනක් තිබුණත් ඉල්ලුම් කරනවා. නමුත් කාන්තාවක් ඉල්ලුම් කරන්නෙ අවම වශයෙන් දහයෙන් හතක් වත් තිබෙනවා නම් පමණයි. මේ සමීක්ෂණයන්ගෙන් මතු වුණ කරුණු.

ඉතිං ගැටලුව තිබෙන්නෙ කොතනද? අපි අපේ දියණිවරුන් කොතරම් බලසතු කළත්, පවුලක වගකීම් බෙදා ගන්න, අපේ පුතුන්ට දිය යුතු මූලික සවිබල ගැන්වීම දෙන්න සමාජයක් විදිහට අපි අසමත් වෙලා නේද? දුවට බෝනික්කෙක්. පුතාට කාරෙකක්. පුතා බෝනික්කා නැළෙව්වොත්, "පිරිමි ළමයි බෝනික්කො නළවන්නෙ නැහැ." ඒ අපේ සමාජයේ ප්‍රතිචාරය. පුංචි කාලෙ බෝනික්කෙක් නළවන්න ඉඩක් නැති වුණ පිරිමි දරුවා තාත්තෙක් වුණ දවසට තමන්ගෙ දරුවා නළවන්නෙ කොහොමද?

ඉතිං මේ කාන්තා දිනයේදී අපි හිතන විදිහ වෙනස් කර ගන්න උත්සාහ කරමු. අපේ දුවලාට අධ්‍යාපනයෙන්, හැකියාවන්ගෙන් ඉහළට යන්න උදව් කරන අතරම අපේ පුතාලට පවුලේ සාමුහික වැඩ වල වගකීම ගන්න පුරුදු කරමු. දුවට දවසක පවුලේ කෑම වේලක් හදන්න දෙනවා වගේම අපේ පුතාටත් ඒ අවස්ථාව දෙමු. එය කවදා හරි දවසක ඔබේ පුතාටම ප්‍රයෝජනයක් වෙයි. ඉතිං අපි අපේ දියණියන් වගේම අපේ පුතණුවන්වත් සමානත්මයෙන් යුත් ආකල්ප වලින් සහ අත්‍යවශ්‍ය හැකියාවන්ගෙන් සවිබල ගන්වමු.

ජයනි ප්‍රනාන්දු

# සුව හා රැව



## ගැබ්ගෙල පිළිකාව වළක්වා ගනිමු

ලංකාවේ කාන්තාවන්ට වැළඳෙන ප්‍රජනන පද්ධතිය හා සම්බන්ධ පිළිකා අතරින් ගැබ්ගෙල පිළිකාව බහුලතම පිළිකාව ලෙස සැලකේ. පිළිකා නිසා ලංකාවේ සිදුවන කාන්තා මරණ අතර ගැබ්ගෙල පිළිකා නිසා සිදුවන මරණ දෙවැනි වන්නේ පියයුරු පිළිකා මරණවලට පමණි. ගැබ්ගෙල පිළිකාව හියුමන් ද පැපිලෝමා වෛරසය (HUMAN PAPILOMA VIRUS) නමැති වෛරසයක් මඟින් ගැබ්ගෙලේ ඇතිවන ආසාදන හා රෝගාබාධ තත්වයන් නිසා හටගන්නා බව තහවුරු වී ඇත.

## හියුමන් පැපිලෝමා වෛරසය

හියුමන් පැපිලෝමා වෛරසය යනු එකිනෙකාට සමානකම් දක්වන වෛරස් වර්ග 100කින් පමණ සැදුම්ලත් වෛරස කාණ්ඩයකි. මෙම වෛරසය මුඛ කුහරයේ හා ස්ත්‍රී ප්‍රජනන පද්ධතියේ ශ්ලේෂ්මල පටලවල ජීවත් වේ. එම වෛරසය මිනිසාගේ සම මත ජීවත් වූ පමණින් බාහිර රෝග ලක්ෂණ ඇති නොවේ.

## ගැබ්ගෙල පිළිකාව

ගැබ්ගෙල පිළිකාව යනු වළක්වා ගත හැකි රෝගී තත්වයකි. ලෝකයේ ගැබ්ගෙල පිළිකාවලට ප්‍රධාන වශයෙන්ම ගොදුරු ව න්නේ අවුරුදු 35-45ත් අතර වයසේ කාන්තාවන් වේ. ලෝකයේ ගැබ්ගෙල පිළිකාවලින් මිය යන කාන්තාවන් අතරින් වැඩිපුරම ප්‍රතිශතයක් පෙන්නුම් කරන්නේ දියුණු වෙමින් පවතින රටවල කාන්තාවන් ය.

## ගැබ්ගෙල පිළිකාවේ පූර්ව පිළිකා අවධිය

හියුමන් පැපිලෝමා වෛරසය කාලයක් තිස්සේ ගැබ්ගෙලේ පවතින විට ගැබ්ගෙලේ සෛලවල විවිධ වෙනස්කම් ගණනාවක් සිදු වේ. මෙම වෙනස්කම් නිසා CIN (CERVICAL INTRAEPITHELIAL NEOPLASIA) වශයෙන් හඳුන්වන පූර්ව පිළිකා අවධියක් ගැබ්ගෙලේ ඇති විය හැකිය. ක්‍ෂභ රෝග තත්වයේ මුල් අවධියේදී රෝගියාට විශේෂ රෝග ලක්ෂණ ඇති නොවන අතර එම රෝග තත්වය කාලයක් තිස්සේ පවතින විට එය පිළිකාවක් බවට වර්ධනය වීමට හැකියාව ඇත. මෙය කල් ඇතිව හඳුනා ගැනීම ගැබ්ගෙල පිළිකා ඇති වීමට වළක්වා ගත හැකි ක්‍රමවේදයයි.

## පිළිකා අවදානම වැඩි කරන වෙනත් සාධක

ලිංගිකව එකතු වන විට හියුමන් පැපිලෝමා වෛරසය කාන්තාවක් සහ පිරිමියෙක් අතර හුවමාරු විය හැකියි. ගැහැනු දරුවෙකුගේ ලිංගික ක්‍රියාකාරිත්වය ආරම්භ කිරීමට පෙර හියුමන් පැපිලෝමා වෛරසය සහ ඒ නිසා ඇති වන රෝගී තත්ව ගැබ්ගෙලේ ඇති නොවේ.

HIV රෝගීන්ගේ ශරීරයේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය අඩපණ වන අතර එය ගැබ්ගෙල පිළිකා අවදානම වැඩි කිරීමට බලපායි.

ඊට අමතරව දුම් පානය, පහළ සමාජීය හා ආර්ථික පසුබිම්වල ස්ත්‍රීන්ගේ ලිංගික පද්ධතියේ සනීපාරක්ෂාව අඩු වීම. ගැබ්ගෙල පිළිකා අවදානම වැඩි කිරීමට හේතු සාධක වේ.

## ගැබ්ගෙල පිළිකා අවදානම අවම කර ගැනීමට

ශ්‍රී ලාංකීය කාන්තාවන් අතර සෞඛ්‍ය ගැටලුවක් බවට පත් වී ඇති මෙම ගැබ්ගෙල පිළිකාව අවම කර ගැනීම සඳහා ලිංගිකව එකතු නොවූ කාන්තාවන් HPV එන්නත ලබා ගැනීම, අවුරුදු 35 ට වැඩි සෑම කාන්තාවක්ම අවුරුදු පහෙන් පහට PAP පරීක්ෂණය සිදු කර ගැනීම මඟින් පූර්ව පිළිකා අවධි හඳුනා ගැනීම, දුම් පානය නතර කිරීම සහ හොඳ සනීපාරක්ෂක පුරුදු මඟින් ස්ත්‍රී ප්‍රජනන පද්ධතිය සම්බන්ධ සම පිරිසුදුව තබා ගැනීම යන පියවර අනුගමනය කිරීම අපගේ වෛද්‍ය නිර්දේශය වේ.

නිරංජලා කෞශලය

# ප්‍රජනන සෞඛ්‍ය අයිතීන් පිළිබඳ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක්

ප්‍රජනන සෞඛය අයිතීන් පිළිබඳ සිවිල් සංවිධාන දැනුවත් කිරීමේ පුහුණු කරුවන් පුහුණු කිරිමේ වැඩසටහනතක් ඩාබිඳු සාමූහිකය විසින් 2021/02/19 දින මීගමුව වයිට් පැලස් හිදී පැවැත්විණි.

ස්ත්‍රීයක් වීම නිසාම ඇයට සමාජයේදී ඇයගේ භූමිකාවට වන බලපෑම පිළිබඳව ද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගැටළු සම්බන්ධවද ඇය පැමිණ සිටි සිවිල් සංවිධාන නියෝජතයින් දැනුවත් කිරීම අපූර්ව ලෙස සිදුකරන ලදි.



Grassroot Trust සංවිධානයේ පබා දේශප්‍රිය මහත්මිය විසින් ප්‍රායෝගික තලයේ කාන්තාවන්ට සංස්කෘතිය හා ආගම නිසා විඳින්නට සිදුවන ගැටළු ඇතුළු සංස්කෘතිය තුළ ජීවත්වීමට සමාජය විසින් කරන බලපෑම නිසා ගෘහයේ සිට සමාජ තලය තුළ ඇයට විඳින්නට සිදුවන හිංසනයන් අකටයුතුකම් පිළිබඳ ඇය විසින් මනා ලෙස පැහැදිලි කරන ලදි.

වර්තමාන සමාජය විසින් තවදුරටත් කරපින්නාගෙන යන කන්‍යාභාවය විද්‍යාත්මක පදනම කෙරෙහි ඇයගේ අවධානය යොමු වු අතර ඒ පිළිබඳ සභාව තුළින් ගනිමින් සාකච්ඡා මට්ටමින් මෙන්ම විවිධ ක්‍රියාකරම් මගින් ද වැඩ සටහන පෝෂණය කරන ලදි.



# ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම්

2021.02.31 හා 2021.02.07 දිනයන් වල කටුනායක හා බියගම වෙළඳ කලාප වල සේවය කරන සේවකයින් වෙනුවෙන් ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සිදුවිය.

විශේෂයෙන් නිදහස් වෙළඳ කලාප වල සේවය කරන කම්කරුවන්ට බලපාන සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ තත්වයන් මෙන්ම පවුල් සැළසුම් ක්‍රම පිළිබඳ මෙහිදී වැඩි අවධානය යොමු කොට සාකච්ඡා කළ අතර සේවා ලබා ගැනීමේ දි යොමු වීමට ඇති ස්ථාන, පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන් කාර්යාලයේ සේවාවන් පිළිබඳ මෙහිදී වැඩි දුරටත් දැනුවත් කරන ලදි. එසේම ඩාබිඳු සාමුහිකය විසින් මුද්‍රණය කළ දැනයමු හරි මඟ පොත් පිංචද මෙහි දී බෙදා හරිනු ලැබිණි.

මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය කටුනායක පවුල් සෞඛ්‍ය සේවිකා තමරා කුමාරි මහත්මිය හා බියගම රෝහලේ හිටපු හෙද නිළධාරිණි ජේ.කේ. දමයන්ති මහත්මිය විසින් ලබා දෙන ලදි.






# පාදක කාණ්ඩායම් සාකච්ඡාවක් බියගම දී

බියගම නිදහස් වෙළඳ කලාපයේ කම්කරු කාන්තාවන් සමඟ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ සාකච්ඡාවක් පසුගිය දින (14/02/2021) බියගම දී පැවැත්විණි. එහිදි ලිංගික අයිතිවාසිකම් හා ප්‍රජනන සෞඛ්‍ය පිලිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය වීමසීමට ප්‍රශ්ණාවලියක් යොමු කරන අතර, පවතින කොවිඩ් වංසගත තත්වයේ දී කම්කරුවන් මුහුණපාන්නට සිදු වු ගැටළු සම්බන්ධයෙන් එහිදී වැඩි වශයෙන් සාකච්ඡා විය.





# කාන්තා දිනයට පමණක් සීමා වූ කාන්තාව

ලොව වෙසෙන සියළුම කාන්තාවන් වෙනුවෙන් දිනයක් වෙන්කර ඇත. ඒ සෑම වසරකම මාර්තු 08 වන දිනයයි. එදින කාන්තාව වෙනුවෙන් විවිධ වැඩසටහන් ලොව පුරා පැවැත්වේ. කාන්තාව අති උතුම් ලෙස වර්ණනා කරමින් ඇයව ඉතාමත් ඉහළින් එදිනට තබයි. මාර්තු 9 වන දා සිට මේ සියල්ල අමතකයි. විය යුත්තේ කුමක්ද? මේ විශ්වය පවතින තුරු කාන්තාව ආරක්ෂා කළ යුතුයි. ආරක්ෂාව පමණක් නොව, ඇයට හිමිවිය යුතු සමතැන ලබා දීම,හිංසනය තුරන් කිරීම,ඇයට සමාජයෙන් සිදුවන අසාධාරණය ආදී සියල්ලම වෙනුවෙන් නැගී සිටිම. ආදී සියල්ලන්ම ඇයට හිමි විය යුතුය.

ආසියාතික රටක් වන ශ්‍රී ලංකාව තුළ ඇති නීති පද්ධතිය මීට වඩා ඇය වෙනුවෙන් වෙනස් විය යුතුය. පොදු ප්‍රවාහනයේ ගමන් කිරීමේ දී ඇයට පුරුෂ පාර්ශවයෙන් සිදුවන අපහසුතාවයට නීතිරීති ඇති නමුත් ඒවා ක්‍රියාත්මක වන්නේ නැත. පොලීසියට පැමිණිල්ලක් කරන්න ගිය විට පොලීසියේ නිළධාරීන් ඇය දිහා බලන්නේ අමුතු විදිහකටය. කතා කරන්නේ ඇය මිනි මරලා පොලීසියට ආවා හා සමානවයි. මේ හේතු නිසා අද ඇය අසරණ වී සිටිති.

පෞද්ගලික ආයතනයක් ගත් විට වැඩි වශයෙන් එහි සේවය කරන්නේ කාන්තාවන්ය. පුරුෂ පාර්ශවය ඉතාමත් අල්පය. කාන්තාව අතිකාල කළ යුතුයි, රාත්‍රී සේවය කළ යුතුයි. නිවාඩු නොගත යුතුයි. ආදී නීති රීති සියල්ලම ඇයටය. පුරුෂ පාර්ශවයට මේ නීති රීති තිබුණත් එවා ඔවුන්ට තදබල ලෙස බලපාන්නේ නැත. මේ වන විට ජංගම දුරකථනය සෑම පුද්ගලයෙකුම භාවිතා කරයි. එහෙත් සමහර පෞද්ගලික ආයතනයක කාන්තාවන්ට තමන්ගේ දිවා ආහාරය වේලාවෙදීවත්, විවේක වේලාවෙදීවත් දුරකථනය භාවිතා කිරීමට නොහැකිය. මේ අසාධාරණකම් කාට කිව යුතුද?

අප රට තුළ පෞද්ගලික ආයතන සිය ගණන් ඇත. මේ සෑම පෞද්ගලික ආයතනයක පොදු නීතිරීති එකට ක්‍රියා කරයි. මේ හේතුවෙන් කාන්තාව නිතර අසාධාරණයට ලක් වේ. ඇයගේ මානසිකත්වය බිඳ වැටීම නිසා ඇය නොයෙක් ගැටළු වලට මුහුණ දෙයි. එම නිසා පොදු නීතිරීති පද්ධතියක් පවතීනම් එය කාන්තාවට සාධාරණයක් විය හැකිය. අප රටේ කාන්තාවන්ගේ වැඩි පිරිසක් රැකියාවල නිරත වී සිටින්නේ පෞද්ගලික ආයතන වලය.

මේ සමාජයේ වැඩි වශයෙන් මහන්සි වී වැඩ කරන්නේ කාන්තාවය, නින්දා අපහස විඳින්නේ කාන්තාවය, අසාධාරණ වලට මුහුණ දෙන්නේ කාන්තාවය, බඩගින්නේ ඉන්නේ කාන්තාවන්ය, දුක් විඳින්නේ කාන්තාවන්ය, කවදාද මේ අහිංසක කාන්තාවන් නිදහස් වෙන්නේ මාර්තු 8 දින පමණද? ලොව වෙසෙන සියළුම කාන්තාවන්ට සාධාරණයක් ඉටු වේවායි පතමි..!

**ඩී. කුමුදුනි අබේරත්න**



# ආදරය, විවාහය හා දික්කසාදය

සෑම වසරකම පෙබරවාරි මස 14 වනදාට යෙදී ඇති වැලැන්ටයින් දිනය පෙම්වතුන් විසින් සමරනු ලැබුවේ හදවත උතුරා යන ආදරයෙනි. ඔවුනට අවේනික වූ හදවත සහිත ඊතල සහිත රතු ඇඳුම් වලින් සැරසී තෑගි බෝග රැගෙන ගොස් වැලන්ටයින් දිනය සමරනු ලබන්නේ හද බැඳි සතුටිනි. එම දිනය වෙළඳුන්ට වාසිදායකය. එ දිනවල කඩසාප්පු රක්ත වර්ණයෙන් යුක්ත වන අතර වෙළඳාම් ද සරුවට කෙරී තිබුණි.

එක් දිනකට පමණක් සීමා වී කරන ආදරයේ එල කුමකටද? මුමුණන ආදර වදන් එදිනට පමණක්ද? විවාහ වීමට පෙර පවසන බොලඳ වදන් විවාහයෙන් පසු රළු වන්නේ කෙසේද? ආදරය කරන කාලය තුළ පවසන වදන් අසීමිතය, ඇස් දෙක නිදාගැනීමට නොහැකි තරම් වදන් බොළඳය, බබා, සුදූ, පැටියා, සුදු කෙල්ල යන ආදරයට කියන කථා බොළඳ වුනාද? වෙන්නේ විවහායෙන් පසුවය. මුලදී බැන්ද ආදරයේ මිහිර පැලදොරින් පැන ගොස්ය. පෙර උපමා වල සඳහන් වී තිබුණේ සැමියා බිරිඳගේ දෙවියාය කියාය. නමුත් අද පවතින ආර්ථිකය තුළ බිරිඳ සැමියාගේ දෙවියාය. අද පවතින ජීවන තත්වය තුළ පවුලේ සම්පූර්ණ බර දරන්නෙ බිරිඳ අතින් නිසාය. ඉන් පසු බොහෝ පවුල් වල වචන හැසිරීම ඉතා නුසුදුසුය. කලින් තෙපලු වදන් වෙනුවට සත්තු වත්තට නිවස තුලය. පවුල් සංස්ථාව බිඳ වැටෙන තත්වයකට පත් වේ. ගීත වල තියෙන්නේ සැරයටියෙන් අපි යනෙන් තුරා සංසාරේ අපි එකට ඉමු කියලා. විවා ගිවිස ගන්නේ සැපේ දී මෙන්ම දුකේදී විපතේදී එකට ඉමු කියලා.

නමුත් අද වන විට උසාවි තුළ වැඩි පුර ඇත්තේ දික්කසාද නඩුය. එයින් පැහැදිලි වන්නේ වසර 4-5 යනවිට විවාහා ජීවිත අවසන් බවයි. මෙයට හේතු සාධක සොයා බැලිය යුතුය. පවතින සංස්කෘතියේ වරදක්ද? නැත්තම් රට නවීකරණය නිසාද යන්න විමසීම් වටී.

**සමන්**

# සිතුවිල්ල

**සුපුරුදු** පරිදි උදේ පාන්දර චුන් පාන් නලා හඬින් ඇහැරුණු මා හනික දුව ගොස් ලක ලැස්ති වුනේ වැඩ පල වෙත දුව ගියේ නැතිනම් රතු ඉර වැටෙන නිසාය. ඉන් පසු එක හුස්මට මැෂිම පැගුවේ දවසේ ටාගට් එක සපුරා ලන්නටය.

ඒයි පුෂ්පා දවල්ට කන්නේ නැද්ද ඇහුණේ නැද්ද බෙල් එක වදිනවා මට නම් ඉන්න බෑ බඩේ පණුවෝ බොක්සිං ගහනවා. උදේට කෑවෙත් තේ කහට එක්ක පාන් කෑල්ලක්. මාද ඇය සමඟ කැන්ටිම වෙත දුව ගොස් බත් ටික කෑවා නෙවෙයි. එක හුස්මට ගිල දැමූ මා නැවත මැෂිම වෙත දුව යන්න හැදූ විට සුජාතා මාගේ අතින් අල්ලා මොකද බං දුවන්න හදිස්සිය...නැ අනේ කාලා විනාඩියක් වත් ඉන්න නිදහස් අපට තියෙනවාද දවසේ ටාගට් එක නුදුන්නොත් වෙත සංගෙඩිය උඹ දන්නවානේ ඔය කියන්නේ අර සුද්දන්ගේ රට නිදහස් කර ගන්න නිදහස ගැනද. රෙද්ද තමයි මම දන්නේ අපි වැඩ කරන නිදහස් වෙළඳ කලාපය ගැනයි ඇරත් මේ කලාපය ඇතුළේ තියෙන නිදහස ගැන උඹ නොදැන්නවයි.

2021 පෙබරවාරි මස 04 වනදාට යෙදී ඇති 73 වෙනි නිදහස් දිනය සැමරුවා කෝ එදාවත් අපට නිදහසක් තිබුණාද කථාව නම් දොලාවෙන් ගමන පයින් කීවාලු යටත් විජිතවාදීන් ගෙන් රට නිදහස් කර ගත්තද නැවත අපි ඉන්නේ විදේශිකයින්ට යට වෙලා අපේ ඇඟළුම් කෙරුවාවත් එහෙමනේ ඔහේ පලයන් කීවාලු උඹත් දන්න දේවල් තොත්ත බබා වගේ හිටියාට. දැන ගත්තත් අපේ අයිතීන් ඉල්ලා කෑ ගහන්න වැඩ වර්ජන, උද්ඝෝෂණ කරන්න බයයි. කට්ටිය රැල්ලට එළියට බැස්සා දුන්නේ අඩු කැඩෙන්න අපි යන්තම් දුවලා බේරුණා. අපේ කට්ටියත් නිතරම කැගහන්නේ දියව් දියව් කියලානේ ඔය දුන්නේ ඇට්ටි හැලෙන්න. අම්මෝ මතක් වෙනතොටත් ඇඟ හිරිවැටෙනවා උද්ඝොෂණ වැඩවර්ජන එපා වුණා. අම්මත් බැන්නා උඹලා ගෑණු ළමයි නේද කොල්ලෝ කරන වැඩ කරන්න නොයා රක්ෂාව ආරක්ෂා කර ගෙන හිටපන් කියලා ඒ වුනාට වදින කොට නම් Gender Balance වුණා.

එක නෙවෙයි මාර්තු 08 වනදාට යෙදී ඇති ජාත්‍යන්තර ස්ත්‍රී දිනය ගැන ඔයා දන්නවාද... මඟුලක් කියනවා ඒ පාර අපේ රට තුළ තියෙන ස්ත්‍රී දිනය සමරන්න වත් අපට නිවාඩුවක් දෙන්නේ නැති කොට මොකක්ද අනේ ඔය ජාත්‍යන්තර ස්ත්‍රී දිනය කියන්නේ උඹලා ඉතින් පොතක් පතක් බලන වැයි බෝඩීමේ වැඩපළයි මිසක්.

ඇමරිකාවේ ඇඟළුම් කම්හලක කම්කරු කාන්තාවන් පිරිසක් පැය 16 වැඩ මුරය පැය 10ක් දක්වා අඩු කරන ලෙස ඉල්ලා කළ වැඩ වර්ජන තුළින් දිනාගත් තම සටන සිහි කිරීම සඳහා මාර්තු 08 යොදා ගෙන ඇත. අනේ ඉතින් අපිත් ඔය පැය ගාණන් වැඩ කරන්නේ ලැබෙන වැටුප සොච්චම් නිසානේ පේ ෂිට් එක නම් දිගට තියෙනවා. ඉලක්කම් අඩුයි කියා. පුෂ්පා පුප්පාගෙ මැෂිම වෙත දිව ගියේය.

සමන්තා

# ප්‍රහේලිකා අංක - 30

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඩ | 2 | | සා | ■ | 3 | 4 |
| | ■ | | ■ | ■ | 5 | ■ | |
| න | ■ | 6 | | සි | | ■ | |
| ■ | ■ | | ■ | ■ | 7 | | ත් |
| ■ | 8 | ■ | 9 | ■ | ය | ■ | ■ |
| 10 | | | ය | ■ | ■ | 11 | ■ |
| ■ | ට | ■ | 12 | | ති | | |
| 13 | | | ■ | ■ | ■ | ක | ■ |

## හරහට

1. මවකට අවසානයට ලැබුණු දරුවා යන අදහස දීමට කටවහරේ යෙදෙන පදයකි.
3. අවශ්‍ය දේවලට වියදම් නොකර තණ්හාවෙන් ධනය රැස් කරන.
6. සිරිසඟබෝ රජු දවස සිටි බව කියන රාක්ෂයෙකි.
7. කිතු බැතිමතුන් දෙවියන්ගේ විවේක දිනය ලෙස සලකා සියලුම වැඩවලින් වෙන් වි සිටින දිනය මෙසේ හැඳින්වේ.
10. තමන්ගේ අදහස් නොව අන් අයකුට වුවමනා පරිදි කටයුතු කිරීමට යොදාලනු ලබන තැනැත්තා යන අදහස දීමට ව්‍යවහාරයේ ඒන පදයකි.
12. යමකු ගේ වත් පෙහොසත්කම සමාජ තත්වය ආදියෙහි ඇති තතු.
13. මේ කාලයට සුදුසු වු.

## පහලට

1. මහනුවර යුගයේ රාජධානියට ඇතුළුවීමට දුර්ගයෙහි පිහිටා තිබුණු හමුදා මුරපොළකි.
2. ඇළ දොළ ගංගා ආදියෙහි වැඩි වතුර උතුරා ගොස් පහත් බිම් යටකර ගලාගෙන යන ජල කඳ
4. ස්ත්‍රී පක්ෂය හැඳීන්වීම සඳහා යෙදෙන පදයකි.
5. උත්සාහය වෑයම යන අරුත දෙයි.
8. කළකිරීමට පත්වී සිටින.
9. නොවෙනස් වන.
11. අසුරයන්ගේ නායකයා.

**මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.**
**ඩාබිඳු සාමුහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**

1 පිටුවෙන්... **කොරෝනාවටත් පරාජය**

ඇය විසින් එහිදී අවධාරණය කළේ කාන්තාවගේ සුරක්ෂිතතාවය පවුල තුළ පවා කඩවී ඇති බවයි. සැමියා, පෙම්වතා යනාදී සමීපතමයන්ගෙන් සිදුවන හිංසනයන් වැඩි වී ඇති බව ඇය එහිදී පැහැදිලි කළාය.එසේම පසුගිය කොරෝනා අවධානම අතැතිව කලාපයේ කම්කරුවන් රටේ ආර්ථිකය අඛණ්ඩව රදා පවත්වා ගැනීම පිණිස දිවි හිමියෙන් කටයුතු කළද ඔවුන්ට හිමි වරප්‍රසාද හා ප්‍රතිලාභ සියල්ල කප්පාදු කිරීමට හාම්පුතුන් පියවර ගත් බවද ප්‍රදේශය තුළ  ලියාපදිංචි නොවීම නිසා රජයෙන් ලැබුණු සහනාධාර කිසිවකට හිමිකම් නොලැබුණු බවද මෙවැනි වසංගත තත්වයන් හමුවේ කම්කරුවන්ගේ රැකියා සුරක්ෂිභාවය තහවුරු කරගැනීම පිණිස හා සමාජ සංරක්ෂණ වැඩපිළිවෙළවල් සකස් කරගතයුතු හෙයින් සියළුදෙනා මේ මොහොතේ ඒකරාශී වී සාධාරණ හා යුක්ති සහගත හඬක් නැගිය යුතුබව අවධාරණය කළාය.

ඉන් අනතුරුව කටුනායක නෙක්ස්ට් ආයතනයේ සේවිකාවක් විසින් කලාපය තුළ ගෙවන ඔවුන්ගේ කටුක ජීවිතය පිළිබඳ අදහස් ඉදිරිපත් කළාය. තමන් ගමේ සිට කලාපය වෙත පැමිණියේ පවුලේ ආර්ථික අපහසුතාවන්ට ශක්තියක් වීමට බවත්, ඒ වනවිට ඇයට කිසිදු සමාජ අවබෝධයක් නොතිබූ බවත් පැහැදිලි කළාය. තමන්ට කම්කරු අයිතීන්, කාන්තා අයිතීන් යනාදිය සම්බන්ධව දැනුම අවබෝධය ලබා දුන්නේ ඩාබිඳු බවත්, අදටත් තමන්ට මිතුරියක මෙන් ඩාබිඳු මහත් ශක්තියක් වන බව ප්‍රකාශ කළාය. කලාපය තුළ තමන් මුහුණ දුන් කටුක සිදුවීමක් පැහැදිලි කරමින් ඇය කියා සිටියේ තමාගේ අත්බෑගය රැකියාවට යන අතරතුරදී උදුරා ගෙන ගිය අවස්ථාවේදී ඒ සම්බන්ධව පැමිණිලි කිරීමට පොලිසියට ගිය විට ඔවුන්ගේ කිසිදු යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු බවයි.

එසේම කොවිඩ් වසංගත සමයේ තමන් මුහුණ දුන් අත්දැකීම් විස්තර කරමින් ඇය පැවසුවේ ඇය සමඟ එකම නේවාසිකාගාරයේ සිටි පුංචි අම්මා හට කොරෝනා රෝගය වැළඳුන බවත් ඒ අවස්ථාවේ දී ආසන්නතමයන් වශයෙන් ඇයට ස්වයං නිරෝධායනය වීමට සිදු වූ බවත්ය. මේ සම්බන්ධව ඇය විසින් සිය ආයතනය දැනුවත් කළ ද ඇය නිරෝධායනය වූ දින 24ක කාලය තුළ ඇයට ආයතනය හරහා ලැබුණේ හාල් කිලෝ 3ක් පමණක් බවයි. ඒ අවස්ථාවේ තමන් වසර 15ක් අඛණ්ඩව සේවය කළ ආයතනය මගින් ලැබුණ සැලකීම සම්බන්ධව තමන් මහත් සේ කලකිරුණ බව ඇය ප්‍රකාශ කළාය. ඇය තවදුරටත් ප්‍රකාශ කළේ ආයතනයේ 800කට වඩා සංඛ්‍යාවකට කොවිඩ් වැළඳුන බවත් ඔවුන්ගෙන් සමහර අයට ආයතනයෙන් කිසිදු දෙයක් නොලැබුණ බවයි. ඉන් අනතුරුව ඇය විස්තර කළේ ආයතනය විසින් මෙවර දෙසැම්බර් බෝනස් කපා හැරීම නිසා සේවකයන් සිදු කළ වැඩ වර්ජනය සම්බන්ධවයි. කම්කරු වැඩ වර්ජනය හේතුවෙන් ආයතනය උත්සව දීමනාවෙන් අර්ධයක් දෙසැම්බර් මස ලබා දුන්නත් ඉතිරිය ලබා දුන්නේ පෙබරවාරි මාසයේ දී බව ඇය ප්‍රකාශ කළාය.

ඉන් අනතුරුව බියගම නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන කම්කරු කාන්තාවක් සිය අත්දැකීම් බෙදා ගත්තාය. කොවිඩ් වසංගත සමයේ ඔවුන් සැමට ලැබුණේ වැටුපෙන් අඩක් පමණක් බව ඇය ප්‍රකාශ කළාය. එසේ වුවද ඔවුන්ගේ දෛනික වියදම් හි කිසිදු අඩුවක් නොවූ බව ඇය පැහැදිලි කළාය. විශේෂයෙන්ම බෝඩිම් කුලී යනාදිය ගෙවීම අනිවාර්ය බවත් රජයෙන් හෝ ඔවුන්ට කිසිදු සහනාධාරයක් නොලැබුණු බවත් ඇය ප්‍රකාශ කළාය. තවද පසුගිය වසරේ දී ඔවුන්ට ආයතනයෙන් බෝනස් ලබා නොදුන් බවත් මෙවර අප්‍රේල් බෝනස් ලබා දීම පිළිබඳව ද කිසිදු තොරතුරක් නොමැති බවත් ඇය වැඩි දුරටත් ප්‍රකාශ කළාය. අවසන් වශයෙන් ඇය ප්‍රකාශ කළේ උදේ පටන් හවස් වනතුරු පැය 11ක් වැනි කාලයක් මැෂිම සමඟ කාලය ගත කරන ඔවුන් හට මෙවැනි වැඩසටහනකට සම්බන්ධ වී එම ඒකාකාරී ජීවිතයෙන් මිදීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තූති වන්ත වන බවයි. කැළණිය විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා අධ්‍යනාංශයේ ආචාර්ය ප්‍රභා මනුරත්න ආරාධිත දේශනය ඉදිරිපත් කරමින් අදහස් දැක්වූවාය. කාන්තා දිනය සමරන අද දිනයේ වැදගත්ම පිරිස වෙළඳ කලාපයේ සේවය කරන කම්කරු කාන්තාවන් බවත් අද මෙම වැඩසටහනේ අරමුණ ඔවුන්ට ගරුත්වය දැක්වීම බවත් ප්‍රකාශ කළාය. ඉන් අනතුරුව ඇය ප්‍රකාශ කළේ අද සමාජයේ කාන්තා අයිතීන් සම්බන්ධව කතා කරන විට "ඔයාලාට මොනවද ඕනේ?" යනුවෙන් බොහෝ දෙනෙක් ප්‍රශ්න කරන බවයි. එසේ නම් කාන්තාවට හිමි කාන්තා දිනයේ දී වත් වැඩ කරන කාන්තාවට නිවාඩු දවසක් ලබා දීම, අවම වශයෙන් දින භාගයක නිවාඩුවක් වත් ලබා දිය යුතු යැයි ඇය යෝජනා කළාය. ඉන් පසුව ඇය පසුගිය දින වල කතා බහට ලක් වූ තරුණියක කෲර ලෙස මරා දැමූ සිදුවීම අවධානයට බඳුන් කළාය. මේ හිංසනය අප තේරුම් ගත යුත්තේ එක් පුද්ගලයකු හට සිදුවූ වූ අපරාධයක් හෝ එක් පුද්ගලයකු විසින් සිදු කළ අපරාධයකට වඩා අප ජීවත් වන සමාජයේම පිළිබිඹුවක් ලෙස බව පෙන්වා දුන්නාය. අද සමාජය තුළ කාන්තාව සූට්කේසය දමා වළ දමා ඇති බව ඇය ප්‍රකාශ කළාය.

ඉන් අනතුරුව ඇය ඉදිරිපත් කළේ බහුතර සමාජය විසින් නගන තවත් සුලබ පැනයකි. එනම් ස්ත්‍රීන්ට නිදහස මොකටද? යන්නයි. ඇය පැවසුවේ ස්ත්‍රීන්ට අවශ්‍ය නිදහස නොව යුක්තිය බවයි. සෑම මනුෂ්‍යයකුටම තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට ඇති හැකියාව බවයි. එහෙත් වර්තමානය වනවිට ආදායම් බෙදී යාමේ විෂමතාවය ඉතාමත් උග්‍ර බවත් ප්‍රභූ වරුන් විසින් එක් රැයකදී වියදම් කරන මුදලට සමාන මුදලක් වන කම්කරුවකුගේ වාර්ෂික බෝනස් පවා ලබා දීම කර්මාන්ත ආයතන මඟ හරින සමාජ ආර්ථික, දේශපාලන පරිසරයක කුමන යුක්තියක් ද යන්න ඇය ප්‍රශ්න කළාය. ඉන් අනතුරුව ඇය විග්‍රහ කළේ ආගම සහ පවුල තුළ පවා කාන්තාව රැවටීමට හිංසාවට ලක්වන ආකාරයයි.

අවසන් වශයෙන් ඇය ප්‍රකාශ කළේ අරගලය අප විසින් ආරම්භ නොකළොත් වෙනත් කිසිවකු එය අප වෙනුවෙන් නොකරන බවයි. අපි අනෙකාගේ අයිතිය වෙනුවෙන් පෙනී සිටියොත් හෙට දවසේ තමන්ට සූට්කේසයකින් අවසන් ගමන්න යන්නට සිදු වුණත් ඒ වෙනුවෙන් කතා කරන්නට පිරිසක් ඉදිරිපත් වනු ඇති බවයි. එසේම අරගලය දුෂ්කර දෙයක් වුවත් අපි එකිනෙකා වෙනුවෙන් පෙනී සිටින සමාජයක අරගලය ජයගත හැකි බවයි. "අපි හෙට ඉරක් වෙනුවට අද ඉරක් උදා කරගන්න උත්සාහ කරමු" යනුවෙන් ඇය සිය දේශනය අවසන් කළාය.

එදින කාන්තා දින සැමරුමට එක් වූ පාර්ලිමේන්තු මන්ත්‍රිනී ආචාර්ය හරිනි අමරසූරිය ද ලංකාවේ කාන්තා කම්කරු අරගල ඉතිහාසය පිළිබඳ අදහස් ඉදිරිපත් කළාය. 1980 වැඩ වර්ජනයෙන් ලංකාවේ වෘත්තිය සමිති ව්‍යාපාරයට විශාල තර්ජනයක් එල්ල වූ බවත් ඒ සමය තුළ ආරම්භ වූ නිදහස් වෙළඳ කලාප තුළ කම්කරුවන්ගේ අයිතීන් කප්පාදු කරමින් කම්කරු ශ්‍රමය උපරිම ලෙස සූරා කෑමේ සිදු වූ බවත් පැවසුවාය. කම්කරු ව්‍යාපාරය මර්දනය කර තිබූ එවන් යුගයක කම්කරු කාන්තාවන් විසින් දියත් කළ පොලිටෙක්ස් අරගලය ඇය සිහිපත් කළාය. කම්කරු කාන්තාවන් විසින් ආරම්භ කළ අවසානයේ ජයග්‍රහණයෙන් අවසන් කළ එවන් ජයග්‍රහණ අපි අද වැනි දිනක මතක් කළ යුතු බවත් ඒවායින් පාඩම් ඉගෙන ගත යුතු බවත් ඇය පැවසුවාය. අවසන් වශයෙන් ඇය ප්‍රකාශ කළේ අත්දැකීම් හරහා අපි පාඩම් ඉගෙන ගත යුතු බවත් සාමුහිකත්වය තුළින් ජයග්‍රහණය කරා ගමන් කළ හැකි බවත් එහෙයින් මෙවන් වැඩ තුළින් අපි එකතු වෙමු යන්නයි.

අවසන් වශයෙන් බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවිකාවක ද සිය අදහස් හා අත්දැකීම් ඉදිරිපත් කරමින් නිදහස් වෙළඳ කලාප රැකියා ජීවිත තුළ අත්විදි කටුක අත්දැකීම් බෙදා ගත් අතර කොවිඩ් නිසා විදින්නට සිදු වූ අපහසුතා මෙන්ම රටට ආදායම් ගෙනෙන කම්කරුවන්ව වගකිවයුත්තන් මගහැර කටයුතු කළ ආකාරයද දරුවන් සිටින මව්වරුන් ලෙස ඒවාට මුහුණ දුන් ආකාරය පිළිබදවද ඇය සභාවට සිය අත්දැකීම් එක් කළාය. අනතුරුව සැමරුම සමාප්ත කරන ලදී. නර්තනයෙන්, ගීතයෙන් සහ හරවත් දේශනයන්ගෙන් සමන්විත වූ මෙවර ඩාබිඳු විසින්  සංවිධානය කළ 2021 කාන්තා දින සැමරුම අපේක්ෂිත ප්‍රමාණයටත් වැඩි කම්කරු පිරිසකගේ සහභාගිත්වයෙන් යුතුව සාර්ථක ලෙස පැවැත්විණ. මෙම සියලු කටයුතු පවතින කොවිඩ් වංසගත තත්වය හමුවේ සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට මුල්තැන දෙමින් සිදු කෙරිණි. එසේම ඩාබිඳු සාමුහිකයේ වෙබ් අඩවිය විවෘත කිරීමද මෙදින සිදු සිදුවූ අතර ඔබට www.dabinducollective.org ඔස්සේ එයට පිවිසිය හැක.

# රට කරන, දරු රකින, එඩිතර දියණියන්ගේ දිනය සමරමින්




ජාත්‍යන්තර ස්ත්‍රී දිනය සිහිකරමින් කලාප සේවකයින් කටුනායක වෙළඳ කලාපය ඉදිරිපිට උත්ඝෝෂනයේ යෙදුන අයුරු

2 පිටුවෙන්... **ඇය**

වර්තමාන සමාජයේ ද අවිවාහක දියණියක් පවුල තුළ සිටියත් ඇයවද විවේචනය ලක් කරන්නේ කිසියම් වරදක් වී ගෙදරට නාකිවන වන බව පවසාය. විවාහක නම්, ඇයට දරුඵල නොලද හොත් ඇය වඳ ගැහැණිය ලෙස සළකයි. මේ හැල්ලුවට පත් වන කාන්තාවන් අද වන තුරු අප සමාජයෙන් තුරන් වී නැත.

ඉහත කී පැරණි. ගතානුගතික සිරිත් වලින් ගැලවී ගන්නට වර්තමානයේ කාන්තාවන් අපොහොසත් වුවද එදාට වඩා වැඩි අධ්‍යාපනයක් ලැබීමට වරම් ලැබී ඇතත් නිවස තුළ ඇති කාර්ය වගකීම් පෙර සේය. ඒ පැරණි සමාජ ආකල්ප තවමත් සමාජය තුළ පවතින නිසාය. කුකුළා හඬන්නට පෙර අවදි වන ඇය රාත්‍රියේ 10 පසු වන තුරු දස දහස් ගාණක් වැඩ ඇය අතින් සිදු කෙරන අතර තම පවුලේ සමාජිකයන් සමඟ නිවස  තුළ වැඩ බෙදා ගැනීමේ ක්‍රමයක් නැත.

පෙරදි පාසැල් තුළ ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ට ගෘහවිද්‍යාව ඉගෙන්නු අතර, දැන් එහෙම ක්‍රමයක් නැහැ කුඩා කළ සිට පාසැල් තුළ ඉගෙන ගනු  ලබන්නේ අම්මා ඉවුම් පිහුම් ගෙදර වැඩ කරනවා, තාත්තා වැඩට යනවා පත්තර, ටිවී බලනවා එලෙසින්ම කාන්තාව දෙවැනි තැනට දමා ඇති බව බිළිඳු කාලේ සිට දරුවන් දකිති. ඒ අනුව වර්තමානයේ ජීවත් වන කාන්තාවද එදා වගේ පීඩනයට පත් වී ඇත.

වර්තමානයේ ජීවත් වන කාන්තාවන් බොහෝ දෙනෙකු විවිධ ක්ෂේත්‍ර තුළ රැකියාවල යෙදී සිටිති. එම නිසා බොහෝ විට ඔවුන් සමබල ආහාරයක්ද නොගනී. එයින් ඔවුන් මන්ද පෝෂණය හා කායිකව, මානසිකව, දුර්වල වීම තුළ තව දුරටත් කොන්වීමට, මුළු ගැන්වීමට බලනු ඇත.

අද රට තුල පවතින ආර්ථික ප්‍රශ්න තුළ කාන්තාවන්ට කුමන හෝ රැකියාවක නියලී සිටීම ඇය නිවසින් බැහැරව යාම තුළ මඟතොටදී ආයතන තුලදී විවිධ බලපෑම් වලට යටත් වීමට සිදුවන අතර ඇය කාන්තාවක් වීම නිසාම උසස්වීම් අහිමි වන අවස්ථා ඇත.

වර්තමානයේ සමාජය විසින් කාන්තාව වෙළඳ භාණ්ඩයක් බවට පත්කොට ඇත. සෑම වාණිජ භාණ්ඩයක්ම ඇගේ රූ සපුව ප්‍රදර්ශණය කරති. මත් ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා ද ඇය යොදා ගැනීම ඉතා කණගාටු දායකය.

ඉහත කී සියළු කරුණු පිළිබඳව විමසිලිමත් විමේදී පෙනී යන්නේ කවරදාකටවත් වඩා වත්මන් කාන්තාව විවිධ පීඩනයන්ට ගොදුරු වන බවකි. තවමත් ගතානුගතික සිරිත් හා පැරණි ආකල්ප තුළ ජීවත් වන කාන්තාවන් වෙයි. මෙය පුරුෂාධිපත්‍යට යටත් නිසාම පමණක් නොව ගතානුගතික සමාජ සිරිත් විරිත් අතහැර දැමීමට ඇති මැලිකම හා වෙනත් ආර්ථික සමාජයක් හේතු නිසා ඔවුන් එම තත්වයට පත්වී සිටි. මෙයින් ගැලවීමට නම් අපේ අයිතීන් සුරැකීමට ඒකරාශී විය යුතුය.

සමන්මලී

කම්කරු පුවත්

# ඩාබිඳු වර්ණවත් කළ ඇගේ දිනය

















අංකඃ 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.